**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය හා ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ධනාත්මක පියවර විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් අගය කර සිටී**

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගනිමින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය නිකුත් කර ඇති 2019.12.31 දිනැති 2156/16 දරණ ගැසට් පත්‍රයෙන් සංශෝධිත 2019.08.07 දිනැති 2135/53 දරණ ගැසට් පත්‍රය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් 2020.06.22 දින දී අගය කරනු ලැබේ. ඉහත සඳහන් ගැසට් පත්‍ර ප්‍රකාරව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සියලුම භාණ්ඩවල නිෂ්පාදිතය පිළිබඳ වැදගත් තොරතුරු සියලුම භාණ්ඩවල ඇසුරුම්, බහාලුම් හෝ එතුම්වල සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් මුද්‍රණය කිරීමට සියලුම නිෂ්පාදකයන්ට, ආනයනකරුවන්ට, බෙදාහරින්නන්ට හා වෙළඳුන්ට නියම කර තිබේ. මෙම නියමයන් පාරිභෝගික භාණ්ඩ අයත්වන කාණ්ඩ 76කට අදාළ වනු ඇත.

2013 සිට 2018 දක්වා කාලය තුළ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට සහ රාජ්‍ය භාෂා කොමිසමට පැමිණිලි 150 කට අධික සංඛ්‍යාවක් ගොනු කරන ලද්දේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව පාරිභෝගික භාණ්ඩ පිළිබඳ වැදගත් තොරතුරු ලබා නොදෙන බව සඳහන් කරමිණි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් කරන ලද පැමිණිලිවල හඳුනාගෙන ඇති භාණ්ඩවලින් වැඩි ප්‍රමාණයක් ඉහත සඳහන් ගැසට් පත්‍රවල අන්තර්ගත කර තිබේ. එහි ප්‍රතිපලයක් වශයෙන්, ගැසට් පත්‍රය බලපැවැත්වෙන දිනය වන 2020.09.01 දින සිට භාෂා තුනෙන්ම මෙම පාරිභෝගික භාණ්ඩ පිළිබඳ අත්‍යවශ්‍ය තොරතුරු වෙත ප්‍රවේශ වීමට සියලුම පාරිභෝගිකයින්ට අවස්ථාව උදාවනු ඇත.

මෙම දිනයේ සිට පාරිභෝගිකයින්ට අවම වශයෙන් නිෂ්පාදන පිළිබඳ මූලික තොරතුරු ලබා ගැනීමට හැකිවීම අතිශයින් වැදගත් වන්නේ එවැනි භාණ්ඩ ඔවුන්ගේ පරිභෝජනයට හිතකර හා යෝග්‍යවන්නේ දැයි සහතික කර ගැනීම සඳහා ය. පාරිභෝගිකයාට වැටහෙන භාෂාවකින් එවැනි තොරතුරු සැපයීම නිසා, පුද්ගලයන්ට තම මව් බසින් (සිංහල හා දෙමළ) උපදෙස් ලබා ගැනීමේ අයිතිය ආරක්ෂා වනවා පමණක් නොව, පාරිභෝගිකයින්ගේ ශාරීරික සෞඛ්‍යය හා යහපැවැත්ම කෙරෙහිද එය සෘජුවම බලපානු ඇත.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් 2013 වසරේ සිටම පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට පෙන්වා දුන්නේ පාරිභෝගික භාණ්ඩවල අත්‍යවශ්‍ය තොරතුරු එනම්, භාණ්ඩයේ නම, උපරිම සිල්ලර මිල, කල් ඉකුත්වීමේ දිනය, නිෂ්පාදිත දිනය, ශුද්ධ බර/පරිමාව, ආනයනික රට/නිෂ්පාදිත රට හා ඇසුරුම් කළ දිනය ආදී තොරතුරු ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් මුද්‍රණය කර ඇති බවයි. සිංහල හා දෙමළ යන භාෂා ද්විත්වය ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා ජාතික භාෂාවන් බව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගන්නා අතර ඉංග්‍රීසි භාෂාව සන්ධාන භාෂාව ලෙස පිළිගැනේ. එබැවින් පාරිභෝගික භාණ්ඩ පිළිබඳ තොරතුරු ඉංග්‍රීසි භාෂාවෙන් හෝ එක් රාජ්‍ය භාෂාවකින් (සිංහල හෝ දෙමළ) පමණක් මුද්‍රණය කිරීම පාරිභෝගිකයාට තොරතුරු ලබා ගැනීමේ අයිතිය උල්ලංඝණය කිරීමකි. 2013 සිට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් කරන ලද පැමිණිලි හරහා මෙම තත්ත්වය විසඳීමට සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිගැනීමට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට බලය සහ වගකීම පැවරී ඇති බව අවධාරණය කරන ලදි.

එම පැමිණිලිවලට ප්‍රතිචාර වශයෙන් වසර ගණනාවක් තිස්සේ මානව හිමිකම් කොමිසම හා රාජ්‍ය භාෂා කොමිසම පරීක්ෂණ ගණනාවක් පැවැත් වූ නමුත් වර්තමානය වන තුරුම සැළකිය යුතු සාධනීය ප්‍රගතියක් ළඟාකර ගත නොහැකි විය.

එබැවින්, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ගොනු කළ පැමිණිවලිවල ප්‍රගතිය පිළිබඳ පාරිභෝගික කටුයතු පිළිබඳ අධිකාරියෙන් විමසා සිටි අතර ඊට ප්‍රතිචාර ලැබිණි. එහි සඳහන් වූයේ 2135/53 දරණ 2019.08.07 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද විධාන අංක 68 අනුව එම විධානයෙහි උපලේඛනයෙහි සඳහන් භාණ්ඩයන්හි උපරිම සිල්ලර මිල, නිෂ්පාදිත කාණ්ඩ අංකය, කල් ඉකුත්වන දිනය, නිෂ්පාදිත ශුද්ධ බර/පරිමාව, ආනයනික රට/නිෂ්පාදිත රට, නැවත ඇසුරුම්කර ඇත්නම් එසේ ඇසුරුම්කළ දිනය ආදී තොරතුරු සිංහල, දෙමළ හා ඉංග්‍රීසී භාෂා තුනෙන් පැහැදිලිව මුද්‍රණය කළයුතු බවට විධාන කර ඇති බවයි. කෙසේවෙතත්, එකී විධාන අංක 68 පරිච්චින්න කරමින් 2156/16 දරණ 2019.12.31 දිනැති ගැසට් පත්‍රය පළ කරන ලද විධාන අංක 71 නිකුත් කරන ලද අතර එකී විධානය 2020.09.01 වන දින සිට බලපැවැත්වෙනු ඇති බවයි.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ උල්ලංඝණය වීම් සම්බන්ධව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ හඬනැගීම හා ඒ පිළිබඳව වගකිවයුතු බලධාරීන් වෙත පැමිණිලි කිරීම පාරිභෝගික අයිතීන් විෂයෙහි පමණක් සීමා නොවූ අතර එය පුළුල් විෂය පරාසයක විහිදී පවතී. මේ හා සම්බන්ධවම තවත් එක් පැමිණිල්ලක් වන්නේ, ඖෂධ ඇසුරුම්වල තොරතුරු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව සඳහන් නොවීම සම්බන්ධව ජාතික ඖෂධ නියාමන අධිකාරිය ට එරෙහිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට හා රාජ්‍ය භාෂා කොමිෂන් සභාවට පැමිණිලි කිරීමයි. අනතුරුව එහි නියමන්ට වගඋත්තරකරුවන් අනුගත නොවීම මත විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මේ වන විට ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් නඩුකරයක් SCFR/102/16 යටතේ ඉදිරිපත් කර ඇති අතර මෙය තවමත් විභාග වෙමින් පවතී. මෙහි සාධනීය පියවරක් ලෙස, හඳුනාගන්නා ලද ඖෂධවර්ග කීපයක තොරතුරු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව 2020.01.01 දින සිට නිකුත් කිරීමට අදාළව ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් 2019.10.14 දිනැතිව ගැසට් අංක 2145/01 යටතේ කටයුතු කර තිබේ.

මෙම ගැසට්පත්‍ර මගින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ සහ පාරිභෝගිකයින්ට තීරණාත්මක තොරතුරු සැපයීමේ වැදගත් ඉදිරි පියවරක් සනිටුහන් කරන අතරම, මෙම නිර්භීත හා පිළිගැනීමේ තීරණ ක්‍රියාත්මක කරනු ඇති බවට කිසිදු සහතිකයක් නොමැති බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් අවධාරණය කර සිටී. භාෂා තුනෙන්ම සියලුම තොරතුරු හා උපදෙස් මුද්‍රණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවිය හැකි ප්‍රායෝගික දුෂ්කරතා කිහිපයක් පිළිබඳව ලංකා වාණිජ මණ්ඩලය (ආහාර හා පාන අංශය) විසින් පාරිභෝගික කටුයතු පිළිබඳ අධිකාරියට දැනුම් දී ඇති බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දැනුවත් වී ඇත. මෙම නියෝග ක්‍රියාත්මක කිරීම දැනටමත් ප්‍රමාද වී ඇති අතර, තවදුරටත් ප්‍රමාද වීමට ඉඩ ඇති බවද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් හඳුනාගනු ලැබේ.

එවන් පසුබිමක පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් සහ යහපැවැත්ම ආරක්ෂා කිරීම සඳහා වගකීමෙන් යුතුව කටයුතු කරන ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සියළුම පාර්ශවකරුවන්ගෙන් ඉල්ලා සිටී. මෙම අරමුණු සැම මට්ටමකින්ම ධනාත්මකව හා විධිමත් ලෙස පවත්වා ගෙන යාම සහතික කිරීම සඳහා නිල භාෂා ප්‍රතිපත්තිය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඉදිරියටත් අඛණ්ඩව ක්‍රියාත්මක වනු ඇත.